# ගොවි ගැටළුවට අත්වැලක්

## මහවැලි ප්‍රජාසංවර්ධන සමිති

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ විමර්ශක

**ලලිත් ජයසූරිය විසිනි.**

අවුරුදු ගණනාවක් තිස්සේ ලංකා ජනතාවට හුරු පුරුදු ග්‍රාම සංවර්ධන අදහස අළුත් වේශයක් ගෙන මහවැලි ජලයෙන් තෙත්වන ගොවි ගම්මානවල ගොඩනැගෙමින් පවතී. එනම් ප්‍රජා සංවර්ධනයයි. ප්‍රජා සංවර්ධනය යනු කුමක්ද? එවැන්නක් අවශ්‍ය ඇයි? විශේෂයෙන්ම, මහවැලි ප්‍රදේශයේ ප්‍රජා සංවර්ධන රටාව කුමක් ද, එය ශ්‍රී ලංකාවේ අනිකුත් ජනපද යෝජනා ක්‍රම සහ ගම් වලින් වෙනස් වේ ද? යන්න සලකා බැලීම මේ ලිපියේ පරමාර්ථයයි.

පරණ ජනාවාස ව්‍යාපාර තුළ ප්‍රජා සේවා පහසුකම් එතරම් හොඳින් සංවිධානය වී තිබුනේ නැත. බොහෝවිට, අළුතින් පදිංචි කරවන ගැමියෙකුට පළමුවෙන්ම ඕනෑවෙන කුඹුරක්, ගොඩ ඉඩමක් සහ ගෙයක් ලබා දීම, එකල ආණ්ඩුවේ ප්‍රතිපත්තිය විය. එවැනි පැරණි ජනපද කිහිපයක ම කළ සමීක්ෂණ වලින් පෙනී යනුයේ ගොවිතැනට සෑහෙන වතුර තිබුණු තැන්වල පවා ගොවීන්ගේ එකමුතු කම නැතිවීමෙන් විශාල පිරිසකට වතුර කලට වේලාවට ලබා ගැනීමට බැරි වූ බවය. ඒ එක් සරල උදහරණයක් පමණී. ප්‍රජා සේවා සඳහා වූ හොඳින් සකස් කළ වැඩ පිළිවෙලක් නැති තැන්වල මේ වාගේ අමතර ප්‍රශ්න ඇති විය හැක. අපේ පැරණි ජනපද යෝජනා ක්‍රම වල, බොහෝ දුරට හැම දෙනාටම එක සමාන ආදයමක් හා පහසුකම් ඇති වාතාවරණයක්, තුළ අඳගොවියන් හා ඉඩම් බදු ගෙන ලොකුවට ගොවිතැන් කරන මුදලාලි පෙලැන්තියක් ඇතිවීම මේ වායින් එක් ප්‍රශ්නයකි. පුරාණ ජනපද යෝජනා ක්‍රමවල මුල් පදිංචිකාරයින්ගේ අත් දැකීම් අනුව ඒවායේ ප්‍රධාන දුර්වලකම් කිහිපයක් හඳුනා ගැනීමට පුලුවනි.

1. ජනපද වාසීන්ගේ ආර්ථික දියුණුවට ප්‍රධාන තැනක් දීම නිසා සමාජයේ දියුණුව යටපත් වීම.

2. ප්‍රජා සේවාවන් කිහිපයක් තිබුණත් ඒවා පවා සම්ති ගණනාවක් මගින් පාලනය වීම නිසා, හරිහැටි එක ක්‍රමයකට සකස් නොවීම, උදහරණයක් වශයෙන් සමාජ සේවා දෙපාර්තමේන්තුව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව හා පළාත් පාලන ආයතන ආදිය මගින් එකී නොයෙකුත් ආකාරයේ වැඩ පිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම සහ

3. ප්‍රජා සංවර්ධන වැඩ කටයුතු වල වැදගත්තම පැත්ත වෙත මහජනයාගේ සහභාගිත්වය හරියාකාරව ලබා ගැනීමට බැරි වූ නිසා මේ සුළු සේවාවලින් පවා ඔවුන්ගේ ඇත්ත අවශ්‍යතාවයන් ගැන උනන්දුවීමට නොහැකි වීම මේ අතර වේ.

මහවැලි ජනාවාස කිහිප ආකාරයකින් රටේ අනිකුත් ජනපද යෝජනා ක්‍රමවලට වඩා වෙනස් වේ. විශේෂයෙන්ම එය ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ ඇතිවුණු විශාලම ජනාවාස යෝජනා ක්‍රමය වේ. දසලක්ෂ සංඛ්‍යාත ජනසංඛ්‍යාවකගේ ඉර

මහවැලි ජනපදිකයින් කොටස් කිහිපයකට බෙදිය හැක.

**මහවැලි සමාජය**

- පුරාණ ගම්වාසීන්
  - මහවැලි යෝජනා ක්‍රමය නිසා ඉඩම් අයිතිය වැඩිවුණු අය
  - යෝජනා ක්‍රමය නිසා ඉඩම් අයිතිය අඩුවූන අය
- පිටස්තර ඉඩම් ලාභීන්
  - ව්‍යාපාරයේ අවශ්‍යතා සඳහා ඉවත් කරන ලද ප්‍රදේශවලින් පැමිණි අය
  - ඡන්ද කොට්ඨාශ මට්ටමින් තේරූ අය

ණම මේ තුළින් විසඳෙන අතර, ව්‍යාපාරයේ ප්‍රතිඵල ඔවුනට පමණක් නොව ඉන් පිටස්තර වෙසෙන සමස්ත ලංකා ජනතාවටද බලපානු ඇත. මේ තත්වය උඩ රටේ අනිකුත් ගොවීන්ට වඩා විශේෂ පහසුකම් සමහර අවස්ථාවලදී මහවැලි ගොවීන්ට ලැබිය යුතුය යන තර්කය බොහෝ දුරට පිළිගත හැක.

මෙවැනි වෙනස් කම් තිබුනත්, කවුරුත් "මහවැලි ඉඩම් ලාභීන්" යන පොදු හැඳින්වීම යටතේ සැලකිය යුතුය. එසේ නොවුන හොත්,

1. ඉඩම් ලැබූ අය අතර භේද ඇතිවිය හැක.
2. පුරාණ ගම්මුන් අතර හා අළුතින් ඉඩම් ලැබූ අය අතර නුරුස්සන ගති ඇතිවිය හැක.
3. වැඩි සැලකිල්ල නිසා තවත් අතකින් රාජකාරි කටයුතු අමාරුවිය හැක.
4. මහවැලි ව්‍යාපාරය පොදු සේවාවක් නිසා හැම ඉඩම් හිමියකුම සමාන පහසුකම් ලැබිය යුතු වෙයි.

මේ ගැටළු නිරාකරණය කරන එක විශේෂ උපක්‍රමයක් ලෙස එක් එක් ප්‍රදේශයෙන් පැමිණි ඥාති හිත මිත්‍ර පිරිස් හැකිතාක් දුරට එක ගමකම පදිංචි කරවීමට මහවැලි අධිකාරිය උත්සාහ ගෙන ඇත.

ඉහත සඳහන් කරන ලද මූලික කරුණු අධ්‍යයනය කිරීමෙන් පසුව, මහවැලි "ප්‍රජා සංවර්ධන සමිති" සහ ඒ සමඟ අත්වැල් බැඳ ගෙන යන "ඒකක කළමනාකාරිත්ව රචාව" ඇතිකර තිබේ. මෙම ඒකක කළමනාකාරිත්ව රචාව තුළින් කුඩා ඒකක තුළ සියලුම කටයුතු එකම නිලධාරියෙකුගේ පාලනය යටතට පත් කොට ඇත. සාමාන්‍යයෙන් ඒකක කළමනාකරුවෙකුගේ බල ප්‍රදේශයේ පවුල් 100–250 ක් පමණ ජීවත් වේ. ඔහුගේ "ප්‍රජාව" තුළ ප්‍රජා සංවර්ධන සමිති ගොඩ නගා ඇත. සියළුම සහනාධාරයන් ජන්පද වැසියන් අතට පත්වන්නේ ඒකක කළමනාකරු මගින් නිසා ඔහුගේ මග පෙන්වීම යටතේ ප්‍රජා සංවිධාන ගොඩ නගා ගැනීමේ වාසිදායක තත්වය, මහවැලි ප්‍රදේශ ගණනාවක කරන ලද නිරීක්ෂණ වලින් පැහැදිලි වේ. තවද, ප්‍රජාව කුඩා ප්‍රමාණයේ සමූහයන්ය. එසේම සමාජ ආර්ථික ක්‍රමයන් හා සාමාන්‍ය අරමුණු එකකි. එනිසා, හොඳ ආරම්භයක් මහවැලි සංවර්ධන සමිතිවලට ඇත.

ගොවීන්ට බලපාන අලෙවි කරණ හා නිෂ්පාදන ගැටළු නිරාකරණය ද මෙහිදී සිදුවේ. ඉදිරි කන්නයේ ගොවිතැන් කිරීම සඳහා එකඟතාවයකට පැමිණිය හැකි සැලැස්මක් සාදා ඉදිරිපත් කිරීම තවත් අරමුණකි.

විශේෂයෙන්ම, මහජන සෞඛ්‍යය, පෝෂණ ආධාර, බීමට ජලය සැපයුම, පාරිසරික සනීපාරක්ෂාව, ළදරු උයන්, ආගමික හා සමාජීය උත්සව සංවිධානය ආදී විවිධ කටයුතුවලට ප්‍රජා සංවර්ධන සමිති කැපවී කටයුතු කරනු ලැබේ.

ගොවීන්ට ලැබෙන ණය ආධාර නිසි තැන් වලට ලැබීමට සැලැස්වීමද ප්‍රජා සංවර්ධන සමිතිවල සහායයෙන් කෙරෙන්නකි.

මෙම සමිති වල සාමාජිකයින් වන්නේ, මහවැලි ඉඩම් ලාභී ගොවිමහතුන්ය. එම පවුල් වල වැඩිමහල් යැපෙන්නන්වද, ඡන්ද බලය රහිත සාමාජිකත්වය හිමිවේ. මේ අනුව මහවැලි ගොවීන්, නිශ්චිත වශයෙන් ඒකරාශි වීමත් ප්‍රජා සංවර්ධන සමිති මගින් සිදුවේ.

මීළඟට ඒවායේ රැස්වීම් වලට, ඒකකය තුළ සිටින මහවැලි අධිකාරියේ නිලධාරීන් සම්බන්ධ වන අතර, සමිතියේ සභාපති නිල බලයෙන්ම ඒකකයේ කළමනාකරු වේ. අනිකුත් නිලධාරීන් ගොවීන් අතරින් පත්වේ. මේ අනුව, එක්තරා මූලික දෙයක්, එනම් නිලධාරීන් හා මහජනතාව අතර, මාසිකව තම අදහස් හුවමාරු කර ගැනීමේ අවස්ථාව සම්පූර්ණ වේ. මේ තුළින්, නිලධාරීන්ට තම ගොවීන් සඳහා උපදෙස් හා සේවා විධිමත් පරිදි දියහැකි අතර අනිත් පැත්තෙන්, ගොවීන්ට වැඩ පිළිවෙළවල් සැලසුම් කරණය, අඩුපාඩු හා දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම ආදී යට අවස්ථාව සැලසේ.

සාමාජිකයින්ගේ ආර්ථික හා සමාජ තත්වය එය වර්ධනය කිරීමට අමතරව, මෙය අධ්‍යාපනික මුහුණුවරක්ද වෙයි. සාමාජිකයින් ආර්ථික, සමාජීය, හා වෘත්තියමය වශයෙන් එකහා සමාන කොටසකට අයත් නිසා, සුහදව හා නිද

හස්ව ඔවුන්ගේ සමාන හා පරස්පර අදහස් සාකච්ඡා කර එකඟතාවයකට ඒමට මේ තුළින් ඉඩ ලැබේ.

මහවැලි ව්‍යාපාරයේ දක්නට ලැබෙන තවත් විශේෂ අංශයක් නම් ගොවි පුහුණුවයි. මෙහිදී ගොවි නායකයින්, නිශ්චිත අරමුණු හතරක් එනම්, 1. ජල පාලනය, 2. කෘෂිකර්මය, 3. ප්‍රජා සේවා 4. ණය සහ අලෙවි කරණය ඔස්සේ පුහුණු කරවීමේ වැඩ පිළිවෙලක් වර්ෂ කීපයක සිට ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම ගොවි නායකයින් (මහවැලි ව්‍යාපාරයේදී ඔවුන් හඳුන්වනුයේ අවහැරවුම් නායකයින් වශයෙනී.) ගොවි පුහුණු මධ්‍යස්ථාන වලදී ලබා ගත් දැනුම පුළුල් ලෙස බෙද හැරීමට ප්‍රජා සංවර්ධන සමිති රැස්වීම් ප්‍රමෝජනයට ගනී. ආධාර බෙද හැරීමට වඩා විශේෂ කටයුත්තක් මෙහිදී ඒ සමිති වලින් අපේක්ෂා කරයි. එනම්, ආධාර නොමිලේ හෝ පිනට දෙන්නක් නොව සංවර්ධන ක්‍රියාවලියක් ගොඩ නගා ගැනීමට අතදීමක් පමණක් බවත්, මහවැලි දියෙන් රට සරුවනු දැකීමට, මුලුරටේම ජනතාව මහවැලි ව්‍යාපාරය ගැන බලාපොරොත්තු තබා ගෙන ඇති බැවින් ගොවීන්ට ඒත්තු ගැන්වීමයි.

**වනිතා ලතා**

# වම්බටු කල් තබා ගනිමු

වම්බටු ඉක්මනින් නරක් වන සුළුය. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ එළවළු වාරයට මේවායින් ඉතා විශාල අස්වැන්නක් ලබා ගත හැකිය. එක් කන්නයකදී පමණක් බහුලව ඇතත්, සමහර කාලවලට වම්බටු හිඟය. වම්බටු වාරයේදී ඒවායේ මිල ඉතා පහසුය.

හිඟ කාලයේදී පාරිභෝගිකයිනට මිලදී ලබා ගත හැකිවූත්, පොලිතින්වල අසුරා පිටරට යැවීමට හැකිවූත්, පහසු ප්‍රයෝජනයට ගත හැකි හා කල් තබාගත හැකි ක්‍රමයකි වම්බටු වියළීම.

**නිෂ්පාදන ක්‍රමය**

තෝරාගත් බටුදිග අතට අඟලේ හෝ අඟල් 1 1/2 කැලිවලට කප. සෝද කලාලවල හෝ පිරිසිදු කර ගත් සිමෙන්ති බිමක තුනී කර හොඳින් වියළා ගතයුතු වේ. සේදීමේදී බටු කැබලිවල දිය සීරාව හොඳින් ඉවත් කළ යුතුවේ. හොඳින් වියලුනාට පසු පොලිතින් වල අසුරා වෙළඳපොළ මාර්ගයෙන් පාරිභෝගිකයනට අලෙවි කළ හැකිය.

**පිසීමේ ක්‍රමය**

පිසීමට පළමුව වියළි වම්බටු කැලි මඳ උණු දියෙහි විනාඩි 1/2 ක් පමණ පොඟවා ගත යුතුය. පසුව තෙලෙන් තෙම්පරාදු කිරීම හෝ උකු පොල් කිරි යොදා තෙලට සිඳෙන තෙක් උයා ගත හැකිය. පිසීමේදී ලුණු, රම්පෙ, කරපිංචා, අමු මිරිස්, මිරිස් කුඩු, තුනපහ කුඩුද යොදා ගනු ලැබේ. වියළා වම්බටු පිසීමේදී අමු බටු පිස ගැනීමට යන කාලයත් ශ්‍රමයත් ඉතිරි කර ගත හැකිය.

**නිගමනය**

වම්බටු වාරයේදී ඉතා අඩු මුදලකට විශාල වශයෙන් වම්බටු ලබා ගත හැකිවේ. වියළි වම්බටු සෑහෙන කලක් තබා ගත හැකිය. වම්බටු හිඟ කාලයට මේවා වැඩි මිළකට (විශේෂයෙන් නගරබද) අලෙවි කළ හැකිවේ. මෙය ගෘහ කර්මාන්තයක් වශයෙන් මතුවට දියුණු කළ හැකි කර්මාන්තයකි.

**ගොවි ජනතාව නිතිපතා ලබාගැනීමට දායක වන්න**

**වසරක දායක මිල රු: 5.00**